# අරගලය

සූරියකන්ද බේදවාචකය



07 කොටස

**සූරිය කන්ද සිසු ඝාතනය අපේ රටේ සිදුවූ අති බිහිසුණු කෲර බේදවාචකයකි. මේ එම ඝාතනය පිළිබඳ රහස් පොලිසිය කළ අපක්ෂපාතී පරීක්ෂණයේදී ඊට මුල් වූ කරුණු ඇසුරින් සකස්වූ ලිපියකි.**

**මෙම දරුවන් හයවන කාලතුවක්කු බළකාය විසින් අත්අඩංගුවට ගත් බවත් පසුව ඔවුන් සෙවණ හමුදා කඳවුරේ රඳවා ගෙන සිටි බවත් ජාත්‍යන්තර ක්ෂමා ආයතනය පරීක්ෂණ වාර්තාව පෙන්වා දෙයි. දරුවන් පැහැරගත් දිනය, ස්ථානය, ආකාරය සහ ඒ කවුරුන් විසින් ද යන්නත් එහි සවිස්තරව සඳහන් කර ඇත. මෙම වාර්තාව 1991 ඔක්තෝබර් මාසයේදී රජයට ඉදිරිපත් කරන ලදී.**



# ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් පරීක්ෂණය

**පුනරුත්ථාපන කොමසාරිස් බ්‍රිගේඩියර් ආනන්ද විජේසේකර ප්‍රකාශය**

දෙමාපියන්ගේ ඉල්ලීම මත අපි පරීක්ෂණයක් පටන් ගත්තා. ඒ ඉහළින් ආ නියෝගයක් මත එම පරීක්ෂණ කටයුතු අත්හරින්න සිදුවුණා.

1990 මැයි මාසයේ ඇඹිලිපිටිය දෙමාපියන් හමුවුණ අවස්ථාවේදී කළ ප්‍රකාශනයකි.

එක්තරා ඇමැතිවරයෙක්

මං ඇමතිතුමා හමුවීමට ගියා දරුවා ගැන ඔහුගෙන් විමසුවා.

"මුං මටවත් මේ දරුවන් ගැන කියන්නේ නැහැනේ" ඒ ඇමැතිතුමාගේ පිළිතුර.

"අනේ එහෙනම් මගේ දරුවා ජීවත්ව ඉන්නවද නැද්ද කියලවත් කියන්න" කියලා මම විලාප තියෙනකොට, එතෙක් නිහඬව සිටි ඇමැතිතුමා;

"දැන් මේ ළමයි නැහැ කියලා කිව්ව."

විදුහල්පතිනි කළුගම්පිටිය මහත්මිය

පුතා වරදක් කරලා නැත්නම් දඬුවම් කරන්න නැත්නම් නිදහස් කරන්න කියලා අපි ඇමැතිතුමාට ලියුමක් දුන්නා. ලියුම කියවල ඇමැතිතුමා කිව්වෙ මෙයයි.

"මෙයාද හදවල පුදුමයිනේ! මෙයා තාම ජීවතුන් අතර ඉන්නවා? මම හිතුවෙ මෙයාව දැනටමත් මරලා දාලා කියලයි."

නන්ද මැතිව්

(යෞවන හා ක්‍රීඩා කටයුතු භාර ඇමැති)

මෙම ප්‍රදේශය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රී නන්ද මැතිව් මහතාත් මහේෂ් දනන්සූරිය පළාත් සභා මන්ත්‍රී යන දෙදෙනාම කිව්වේ දරුවන්ගෙන් ප්‍රශ්න කරලා දවසකින් දෙකකින් නිදහස් කරාවි, බය නැතුව ඉන්න කියලයි.

- - දෙමාපියන්

රන්ජන් විජයරත්න

(හිටපු ජාතික ආරක්ෂක ඇමැති)

මෙවැනි ළමයින් කණ්ඩායමක් රජයේ හමුදාව විසින් හෝ පොලිසිය විසින් හෝ අත්අඩංගුවට ගෙන නොමැත.

90.10.24 පාර්ලිමේන්තුවේදී

වින්සන්ට් පෙරේරා

:පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ ඇමැති*

මෙම දරුවන් ආයුධ සන්නද්ධ මැර කණ්ඩායමක් ගෙන ගොස් ඇත. ඔවුන් ආගිය අතක් අපි දන්නේ නැත.

92.05.02 පාර්ලිමේන්තුවේදී

ළමයින් මැරුවේ කළු බළල්ලු

ප්‍රේමදාස උඩුගම්පොළ

(හිටපු නියෝජ්‍ය පොලිස්පති)

1. "තුරන් කිරීමට අවශ්‍ය පුද්ගලයන්ගේ නම් ලැයිස්තු පාලක දේශපාලන පක්ෂයේ ප්‍රාදේශීය නායකයන් විසින් කළු බළලුන් හට සපයන ලදී"

2. "මේ ශිෂ්‍යයන් තිස් දෙදෙනා ප්‍රදේශයේ කඳවුරක යුද හමුදා නිලධාරීන් 03 දෙනකුගේ ප්‍රධානත්වයෙන් යුතු කළු බළලුන් කණ්ඩායමක් විසින් පැහැර ගෙන යනු ලැබුණා. මේ ශිෂ්‍යයන් ගැන ක්‍රියා කිරීමේ කොන්ත්‍රාත්තුව කළු බළලුන්ට පවරන ලදී."

3. "වෙනත් කිසිවකු දැකීමට පෙර හෝ කිසිවකු සමඟ කතා කිරීමට හෝ ඉඩ නොදී මේ ළමයින් අල්ලාගත් පිරිස විසින්ම එම හමුදා කඳවුරේ ම රඳවා තබනු ලැබූහ. ඔවුන්ගෙන් ප්‍රශ්න කරනු ලැබීමේදී දෙන ලද දරුණු වද හිංසා නිසා ශිෂ්‍යයන් 2 - 3 ක් මිය ගියහ. ඉන්පසු මෙම ශිෂ්‍යයන් පැහැර ගෙන යාමට නියෝග දුන් තම දේශපාලන ස්වාමීන් ද සමඟ තීරණයක් ගත්හ. ඒ තීරණය නම් මේ සිද්ධිය පිළිබඳ කිසිදු සාක්ෂියක් සොයා ගැනීමට නොහැකි වන සේ ඉතිරි ශිෂ්‍යයන් සියලු දෙනාම විනාශ කිරීමයි. මෙම සිද්ධිය ගැන ඇඹිලිපිටිය ප්‍රදේශයේ ජනතාව හොඳින් දනිති."

4. " මේ ළමයි පැහැර ගෙන යනු ලැබූ තැන් සිට ඔවුන් ඔවුන් විනාශ කර දැමීම දක්වාම සිදු වූ සියල්ල ප්‍රදේශයේ ජනතාව හොඳින් දනිති. ඔවුන්ට එම ළමයින් පැහැර ගෙන යෑමට පැමිණි පුද්ගලයන් හොඳින් හඳුනා ගත හැකිව සිටිනවා පමණක් නොව ඔවුන්ගේ නම්වලින් දනිති."

මවුපියන් මෙතෙක් කළ කන්නලව්

බලධාරීන්ට යැවූ ලිපි සංඛ්‍යාව 500 ඉක්මවයි

1. 1990 පෙබරවාරි හත පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් ආනන්ද වීරසේකර හමුවේ කරුණු කීම.

2. රත්නපුර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී හමුවේ කරුණු කීම.

3. 1990 නොවැම්බර් 16 සිට විසි හය දක්වා ඇඹිලිපිටිය සහකාර පොලිස් අධිකාරිය හමුවේ අපරාධය ගැන කටඋත්තර දීම.

4. 1990 නොවැම්බර් 24 රත්නපුර නියෝජ්‍ය පොලිස්පති හමුවේ කරුණු ඉදිරිපත් කිරීම.

5. 1990 ජූනි 10 දින මානව හිමිකම් බලකායේ සභාපති ඒ.ජේ.එෆ්. සෝසා මහතා ඉදිරියේ සියලු දෙමාපියන් සාක්ෂි දීම.

6. 1991 ජූලි 24 දිනවලදී පැමිණි ආරක්ෂක අමාත්‍යංශයේ නිලධාරීන් දෙදෙනකුට විස්තරාත්මකව කරුණු කීම.

7. 1991 අගෝස්තු 15 - 17 දිනවලදී කොළඹ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයෙන් පැමිණි පොලිස් නිලධාරියකුට වාර්තාවක් සැපයීම.

8. 1990ක නොවැම්බර් 2 දා හිටපු ජනාධිපති උපදේශක බ්‍රැඩ්මන් වීරකෝන් හමුවී සම්පූර්ණ ලිඛිත ලියවිල්ලක් භාර දීම.

9. 1992 ජනවාරි 8 සිට 15 දක්වා සබරගමු නියෝජ්‍ය පොලිස්පතිගේ මෙහෙයවීමෙන් ආ පරීක්ෂක කණ්ඩායමට තොරතුරු කීම.

10. 1992 ජනවාරි 11 දින දෙවන වතාවටත් ඇඹිලිපිටියට හා මානව හිමිකම් බළකායට කරුණු කීම.

11. 1992 මාර්තු අටවැනිදා ඇඹිලිපිටිය පොලිස් අපරාධ අංශය පොලිස් පරීක්ෂකවරයකු මගින් කටඋත්තර ලබා ගැනීම.

12. 1992 අප්‍රේල් 8 අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවරයකු නායකත්වයෙන් ඇඹිලිපිටියට පැමිණ විශේෂ රහස් පොලිස් කණ්ඩායම මුහුණ දීම.

13. 1992 අප්‍රේල් 28 දා ඇඹිලිපිටියට පැමිණි හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාසට දුක් ගැනවිලි ලිපියක් භාර දීම.

හබයාස්කෝපස් නඩු පැවරේ

1992 ඔක්තෝබර් මාසයේ දී දෙමාපියන් විසින් කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ හබයාස්කෝපස් නඩු දාසයක් චූදිතයන් විසිදෙනකුට එරෙහිව අතුරුදන් වීම සම්බන්ධයෙන් පවරන ලදී. දැනට නඩු හයක පමණ සාක්ෂි විභාග ආරම්භ කර ඇත.

මළමිනිය ගොඩ ගැනීම

පළමු දිනය

(94 ජනවාරි 3)

පැල්මඩුල්ලෙන් පිටත්වී රක්වාන දෙනියාය පාරේ කඩමුදුන හන්දියට පැමිණීමට පැය එකහමාරක පමණ කාලයක් ගත වූ අතර කඩමුදුනේ සිට සූරිය කන්ද ගමන අතිශයින් දුෂ්කර ගමනක් විය. පාර ඉතා පටුය. කිසිදු ජනාවාසයක් නොමැති දුර ප්‍රමාණය කිලෝමීටර් තුනක් පමණ වුවද, එම මුළු දුරම අඩි 2000 නැගීමකින් ගමනේ දුෂ්කරතාව නිසාම වාහන කිහිපයකට කඳු පාමුල රැඳෙන්නට සිදු විය.

ලැබී තිබූ හෝඩුවාවන් අනුව භික්ෂූන් අට දෙනාගේ සිරුරු දමා ඇති ඇඳි පාලම අසල මිනී වළවල් සෙවීම පළමුවෙන්ම ඇරඹිණි. ඇඳි පාලම මත සිට ඔයේ දියබැස්ම දෙස බැලූ විට, අලුත් පස් සහිත පස් ගොඩවල් කීපයක්ම තිබුණ නිසා, භික්ෂු සිරුරු සහිත ස්ථානය පාදා ගැනීම අසීරු විය. මාධ්‍යවේදීන් මෙන්ම විපක්ෂ නායකයන්ද ගලින් ගලට පනිමින් ප්‍රදේශය සිසාරා බුරුල් පස් සහිත ස්ථාන සෙවීම, බලා සිටින්නෙකුට අපූරු දර්ශනයකි. "මෙන්න මෙතන හිස් පතරොම්" කිසිවෙක් ඔය පහළින් සිට හඬ ආ දෙසට දිවූහ. ඇත්තටම පතරොම් කොපු එකක් නොව කීපයක්ම ඔවුනට හමුවී තිබිණි. එහෙත් මිනී වළේ හෝඩුවාවක් සොයා ගැනීම පහසු නොවුණේ සමහරක් ඒ වන විටත් මන්දෝත්සාහී තත්ත්වයට පත්ව සිටියහ. "කවුද දුන්න ලණුවක් වගේ" එකකු මුමුණනු ඇසුණි. සංවිධායකයෝ එක් වී තත්ත්වය සාකච්ඡා කළහ. අලුත් පස් සහිත ස්ථාන කිහිපයෙන් එක් ස්ථානයක් තෝරා ගැනීමට එහිදී තීරණය විය. වළ සෙවීම සඳහා පිරිසක් එහි රඳවා රූපවාහිනී කුලුන අසල මිනී වළවල් සෙවීමට සෙසු අය යා යුතු යැයි තීරණය විය.

කුලුන අසල පොලිසියක් ඇති නිසාත්, එය ආරක්ෂක කලාපයක් නිසාත්, පොලිසිය අස්වැසීමට අපි කඳුකර සිරි නැරඹීමට පැමිණි බවක් අඟවමින්, කුමාරතුංග මහත්මිය යෝජනා කළාය. ඊට එකඟ වූ අපි සැම ඇගේ රිය පෙරමුණට දමා ආරක්ෂක කලාපය මාර්ග බාධකයක් අසලට සේන්දු වුණෙමු. මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂක භටයෝ ගොස් පොලිස් නිලධාරීන් හමුවේ කුලුන පිහිටි කඳු මතට ගොඩවී අවට සිරි නැරඹීමට අවසර ඉල්ලූහ. අවසර ලැබිණි. මිනී වළවල් පිළිබඳ හෝඩුවාවේ සැලසුම් අප අත වූ අතර එහි දැක්වුණ ටෙලිකොම් මැන් හෝල් එක සෙවීමට ටෙලිකොම් කුලුන වෙත අපි ගියෙමු. එහි මැන් හෝල් එකක් නොතිබුණි. "වැඩේ වැරදිලාද" ප්‍රශ්නයක් සැම මුවකටම ලැබිණි. ටෙලිකොම් ආරක්ෂකයන් වෙත ගොස් විමසූ කල එවැන්නක් නොමැති බැව් පැවසූහ. යළි හෝඩුවා සැලැස්ම ගෙන මුල සිට කියවා බැලුවෙමු. වැරදී ඇත්තේ අපිටමය. එහි වූ අවසාන වංගු අසල යන්න නොසලකා අපි මීටර් 300ක් පමණ ඉදිරියට ගොස් ඇති බව වැටහුණේ එවිටය. අවසාන වංගු වෙත ආපසු පැමිණියේ, කාගේත් මුවග සිනහවක් නැගිණි. යළි බලාපොරොත්තු මතුවිය. ටෙලිකොම් මැන් හෝල් එක එහි විය. ඒ මතට වී ඉදිරිය බැලූ විට ඩෝසර් කැපුම පැහැදිලිව පෙනේ. දැන් ප්‍රශ්නය මිනී වළවල් සෙවීමයි.

කටු පඳුරු සහිත වළ බුල්ඩෝසර් කැපුමේ මුලින්ම තිබුණි. එහි කටු පඳුරු ඉවත් කර වළ පෑදීමට පැල්මඩුල්ලෙන් පැමිණි පිරිසක් යෙදවෙනි. පළමු අඩිය දැක ලොකු කළු ගල් වලින් පිරී තිබිණි. පිරිස ඉතා අසීරුවෙන් ඒවා ගොඩ දමන තෙක් ඉතිරි වළවල් සෙවීම සඳහා තවත් පිරිසක් යෙදවෙනි. රූපවාහිනී කුලුනු කඳු මුදුනට නැගුණු එස්.බී. දිසානායක මන්ත්‍රීවරයා බුල්ඩෝසර් කැපුමේ කෙළවර සරුවට වැඩුණු තණ හා මානා පෙනෙන බැව් ඉහළ සිට හඬ නගා කීවේය. පිරිසක් එතැන සුද්ද පවිත්‍ර කිරීමට පටන් ගත්හ.

**(භීෂණ සමයේ ශ්‍රී ලංකාවේ සිටි ඇමෙරිකන් පුවත්පත් කලාවේදියකු වන ස්ටීවන් කෝල්ගේ සටහනකින් උපුටා ගන්නා ලදී)**

**ලබන සතියට**

සැකසුම:රවිප්‍රසාද් හේරත්